# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,156 — 1960 ජූලි 8 වැනි සිකුරාදා — 8.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 481 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 484 | ආණ්ඩුවේ තොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 489 | රට මිශ විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ඔඩු බෑහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන පසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා මෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සෞඛ්‍ය නාද්ද යන පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැනෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු නම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට ගැනෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මිහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවත් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් සහ මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) **සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.**

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) **මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම උපදේශක තනතුර

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර තම අත් අකුරින්ම පුරවා 1960 ජූලි මස 25 වන දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ, "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට එවිය යුතුයි.

**ස. ලි.**—ඉල්ලුම් පත්‍ර බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

ඉල්ලුම් පත්‍ර ලැබුණු වග දැනුම් දෙනු නො ලැබේ.

2. වැටුප්.—රුපියල් 1,620න් පටන්ගෙන රුපියල් 120 සේ වාර්ෂික වැඩිවීම් 19කින්ද, රුපියල් 180වේ වාර්ෂික වැඩිවීම් 4කින්ද, රුපියල් 4,620 දක්වා වැඩිවෙන වැටුපක් මෙම තනතුරට හිමි වේ. රුපියල් 2,820 හා රුපියල් 4,080ට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් ද වේ.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. අර්ථසාධක අරමුදලට දායක විය යුතුයි.

4. **සේවා කොන්දේසි :**

(අ) පත්වීම තුන් අවුරුදු පරීක්ෂාවකට භාජන වේ;

(ආ) තෝරාගත් අපේක්ෂයා දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට සූදානම් විය යුතුයි;

(ඇ) තෝරාගත් අපේක්ෂකයා සියලුම දෙපාර්තමේන්තු විභාගවලින් නියමිත කාලසීමාව තුළදී සමර්ථ විය යුතුයි;

(ඈ) පරීක්ෂා කාලය ඇතුළත ඔහු තවදුරටත් සේවයෙහි රඳවා ගැනීමට නුසුදුසු යැයි මෙහි පහත අත්සන් කරන්නාට හැඟේ නම් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

5. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) ලාංකිකයෙකු වීම;

(ආ) 1960 ජූලි මස 25 වැනි දිනට වයස අවුරුදු 24ට නො අඩු හෝ අවුරුදු 40ට නො වැඩි හෝ විය යුතුයි;

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ඇති බව හා ගොවිකම් පාසලේ ඩිප්ලෝමා සහතිකය සහ කෘෂිකර්මය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති බව; සහ

(ඈ) මනා චරිතයකින් යුක්ත අයෙකු වීම;

(ඉ) සමාජ සේවා වැඩ පිළිබඳ පුහුණුවක් හෝ සුදුසුකම් හෝ ඇති අපේක්ෂකයින් ගැන විශෙෂයෙන් සළකා බලනු ලැබේ.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පිටපත් පමණක් අමුණා එවිය යුතුයි:—

(අ) උප්පැන්න සහතිකය;

(ආ) ලබාගත් උසස් ම අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍රය;

(ඇ) චරිතය පිළිබඳ ළඟදී ලබාගත් සහතික පත් තුනක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනැවි.

8. මෙම නිවේදනයේ ප්‍රකාර නො වන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව. නා. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1960 ජූලි 2 වැනිද,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේදී ය.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය

(**ස. ලි.**—එවිය යුත්තේ සහතිකවල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නො එවනවාත් හැර තැපෑලේදී නැතිවෙන සහතික පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත.)

1. සම්පූර්ණ නම :—

නම :————.

වාසගම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දිනය හා 1960 ජූලි මස 25 වැනි දිනට වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

4. පියාගේ නම හා රක්ෂාව :————.

5. උපන් ස්ථානය—

අයදුම්කරුගේ පියා :————.

අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.

(ආ) ලාංකිකයෙක් ද යන වග—

(1) උත්පත්තියෙන් ද? :————.

(2) නැත්නම් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද? :————.

7. කසාද බැඳලා ද නැද්ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

9. ගොවිකම් පාසලෙන් ලද ඩිප්ලෝමා සහතිකයේ සහ කෘෂිකර්මය පිළිබඳ ඇති පළපුරුද්ද පිළිබඳව විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. සමාජ සේවා වැඩ පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

11. දනට රක්ෂාවක් තිබේ නම් එය :————.

12. චරිත සහතිකයන් දෙනු ලබන්නන්ගේ නම් සහ ලිපිනයන් : ————.

13. පාසලින් අස්වූද සිට කරන ලද රක්ෂාවන් (සවාමියාගේ නම, සේවය හා සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුයි).

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### කච්චේරි මාණ්ක තනතුරු

කච්චේරි මාණ්ක තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් හා පත් කිරීමේ කොන්දේසි.**—මෙම පත්වීම් ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,860න් පටන් ගෙන වර්ෂයකට රු. 120 සහ රු. 180 බැගින් වැඩිවී රු. 4,620 තෙක් නගී. වාර්ෂික වැටුප් රු. 3,900ට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. සර්වයර් ජනරාල් විසින් පවත්වන ප්‍රයෝගික විභාගයකින් සමත් වී මෙනි රු. 3,900කට වැඩි වාර්ෂික වැටුප් ලැබිය හැකි කඩඉමෙන් උසස් කරනුයේ.

3. **අයදුම් කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවෝ වයස අවුරුදු 20ටත් 30ටත් අතර ලාංකිකයන් විය යුත්තාහ. දනට රජයේ සේවයෙහි නියුක්තවූවන්ට මෙම වයස සීමාව අදාල නොවේ.

**අයදුම්කරුවෝ :—**

(අ) ගණිතය විෂයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාග යෙන් සමර්තව සිටිය යුතුය.

(ආ) ප්ලෑන් ඇඳීම, බිම් මැනීම් හා මට්ටන් ගැනීම පිළිබඳව දනීමක්ද තිබිය යුතුය.

4. **සේවය පිළිබඳව කොන්දේසි.**—මෙම පත්වීම් අවුරුදු 3ක පරීක්ෂණාත්මක කාලයකට යටත් ය.

(අ) තෝරාගනු ලැබූ ආධුනිකයින් සර්වයර් ජනරාල් යටතේ පුහුණුව කින් සමර්තවිය යුතුය. එම පුහුණුවීමෙන් සාමර්තය නොලත් අයගේ සේවය අවසන් කරනවා ඇත. පුහුණුව ලබන කාල යේදී රු. 75ක උප වේතනයක් ගෙවනු ලැබේ.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පුහුණුවීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. ලංකාවේ කවර පෙදෙසක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

(ඇ) රාජකාරි කටයුතු සඳහා මෝටර් වාහනයක් සපයාගත යුතුය. රජයේ රෙගුලාසි අනුව ඔවුනට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඈ) තෝරාගනු ලැබූ අයදුම් කරුවෝ රු. 2,000ක ඇපයක් තැබීමට සූදනම් විය යුතුය.

(ඉ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දනට පණවා ඇති නීති හා මින්මතු පණවන නීති වලටද විශෙෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පණතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ නීතිවලටද තෝරාගනු ලැබූ අපේක්ෂක යන් බැඳී සිටිය යුතුය.

5. තම චරිතය පිළිබඳව මෑතදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

6. මෙයට යාකර ඇති නියමිත පෝර්මය අනුව පිළියෙලකර ගන්නා ලද අයදුම් පත් 1960 ජූලි මස 23 වැනි දින දවල් 12ට පෙර "ඉඩම් කොමසාරිස් තුමා, තැ. පෙ. 500, කොළඹ", යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නියමිත පෝරමයට අනුව පිළියෙලකර නොගත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනවා ඇත.

7. **අයදුම් පත් ලැබුණුබව දන්වනු නොලැබේ.**

8. මෙම ගැසට් පතෙහි I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළ වූද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම්වලට අදාළවූද පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලුම් කෙරේ.

ඒ. සෙන්ට්. වී. වීජේමාන්න,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ජූලි 4 වැනි දින
කොළඹදීය.

## නියමිත පෝර්මය

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—කච්චේරි මාණ්ක තනතුරු

1. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.

2. උපන්දින හා ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතිකයේ පිටපතක් සමග) : ————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පියපාර්ශ්වයේ මීමුත්තාගේ :————.

3. අධ්‍යාපනික සුදුසුකම් (සමර්ථ වූ දින ඇතිව සහතික වලින් පිටපත් සමග).

4. පාසැලින් අස්වූ දින සිට කරන ලද රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සහ දනට ලැබෙන වේතන හා වැටුප් ක්‍රමය : ————.

5. ප්ලෑන් ඇඳීම, බිම් මැනීම හා මට්ටම්ගැනීම පිළිබඳව දනීම : ————.

6. යුද්ධසේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳව විස්තර :————.

7. අමුණා ඇති සහතිකවල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳව දනීමක් ඇත්තවුන් දෙදෙන කුගේ නම්, ලිපිනයන් හා ඔවුන්ගේ තනතුරුත් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................1960.

අයදුම්කරු ලංකාවේ ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ නොඉපදුනි නම් (අ) (ආ) හෝ (ඇ) හෝ (ඇ) (ඈ) දෙකම පිරවිය යුතුය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### වේරහැර මෝටර් කාර්මික අභ්‍යාස පාඨශාලාව

වේරහැර මෝටර් කාර්මික අභ්‍යාස පාඨශාලාවට ඇතුලත්වීම සඳහා ඉල්ලුම්පත්‍ර එවන මෙන් ලාංකිකයන්ට මෙයින් ආරාධනය කරමි.

2. ඉල්ලුම්කරුවන්ට ඉතා අඩු ගණනේ පහත පෙනෙන සුදුසුකම් වත් තිබිය යුතුයි :—

(අ) i. **අධ්‍යයනීක සුදුසුකම් :**

සිංහල හෝ දෙමළ අටවෙනි ප්‍රමාණයෙනුත් ඉංග්‍රීසි 5 වෙනි වෙනි ප්‍රමාණයෙනුත් සමර්ථ වී සිටීම ; හෝ

ii. ඉංග්‍රීසි අටවෙනි ප්‍රමාණයෙනුත් සිංහල හෝ දෙමළ 5 වෙනි ප්‍රමාණයෙනුත් සමර්ථවී සිටීම. (ඉල්ලුම්කරුවා දන් ඉගෙනීම ලබන පාඨශාලාවේ හෝ අවසාන වරට ඉගෙනීම ලැබූ පාඨශාලාවේ අධිපතිවරයාගෙන් හෝ ප්‍රධානාචාර්‍යවරයා ගෙන් ලබාගත් පාඨශාලා සහතික පත්‍රයක් හෝ සහතික පත්‍රයක් තමාගේ අධ්‍යයනික සුදුසුකම්වලට සාක්ෂ්‍ය වශයෙන් ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුයි. යකඩ වැඩ හෝ ලී වැඩ (වඩුවැඩ) පිළිබඳ දනීමක් තිබීම අතිරේක සුදුසුකමක් වන්නේය. මේ දනීම ඉල්ලුම්කරුවාට ඇති බවට සහතිකපත්‍රද ඉල්ලුම්පත්‍රය සමග එවිය යුතුයි.)

(ආ) **වයස :** 1961. 1. 1 වෙනි දා වන විට අවුරුදු 16 ත් 17 ත් අතර වියයුතුයි. (උප්පැන්න සහතිකපත්‍රය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුයි ; අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කටයුතු සම්බන්ධයෙන් නිකුත් කළ උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ඇ) **අඩුම උස :** අඩි 4 අඟල් 10 ක් විය යුතුයි.
**පපුවේ මහත :** හුස්ම පුරවා නොගත් විට පපුව 30"ක් විය යුතුයි.

3. ඉතා අඩු ගණනේ අවශ්‍යවූ සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවෝ

(i) පහත පෙනෙන විෂයයන්—එනම් (අ) අංක ගණිතය, (ආ) (ලංකාව හා ලෝකය පිළිබඳ) සාමාන්‍ය දනීම, (ඇ) වස්තු ඇඳීම හා මෝස්තර ඇඳීම යන මේ විෂයයන්—සම්බන්ධ යෙන් ලිවීමෙන් කරන විභාගයකටද

(ii) යෝග්‍යතා පරීක්ෂණයකටද

කැඳවනු ලැබෙත්.

විභාගය කොළඹදී හෝ කොළඹට ආසන්න ස්ථානයකදී පවත්වනු ලැබේ.

4. විභාගයේ ප්‍රතිඵල අනුව තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ට බොරලැස්ගමුවේ වේරහැර අභ්‍යාස පාඨශාලාවේදී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

5. විභාගයට හෝ අවසාන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ඉල්ලුම්කරුවන්ගේ ගමන් වියදම් ආදිය ආපසු ගෙවනු නොලැබේ.

6. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් අභ්‍යාස පාඨශාලාවට ඇතුළත් කිරීමට කලින් හෝ ඇතුළත් වී මාසයක් ඇතුළතදී ඔවුන් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ඔවුන් ශාරීරික සනීපය අතින් නුසුදුසු බැව් මණ්ඩලීය වෛද්‍ය නිලධාරී මහතාට පෙනීගිය හොත් ඔවුන්ගේ තේරීම අවලංගු කරනු ලැබේ; නැත හොත් ඔවුහු අස් කර දමනු ලැබෙත්.

7. අවසාන වශයෙන් තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ට පුහුණුව නිමවූ පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක් වත් මණ්ඩලය යටතේ සේවය කරන බවට (එක් එක් තැනැත්තා) රු. 1,000 බැගින් ඇප තබන ඇපකරුවන් දෙදෙනෙකු ඇතිව රු. 1,000 ක පොරොන්දු පත්‍රයක් අභ්‍යාස පාඨශාලාවට ඇතුළත්වීමට කලින් අත්සන් කිරීමට නියම කරනු ලැබේ.

8. ඉල්ලුම්පත්‍ර බාරගැනීම 1960 වේ අගෝස්තු මස 9 වෙනි දා දවල් 12 ට නවත්වනු ලැබේ. ඉල්ලුම්පත්‍ර " සේවක මණ්ඩල කළමනාකාර තැන, ගමනාගමන මණ්ඩලය, කොළඹ 5" යන ලිපිනයට එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාර තැන.

1960 වේ ජූනි මස 29 දින,
කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ
200 වෙනි ස්ථානයේදීය.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### කණිෂ්ඨ කාර්මික විද්‍යාලය—ගාල්ල

### අධ්‍යයන වර්ෂය—1960-61

**බිම් මැනීම සහ මට්ටම් කිරීම සම්බන්ධ තුන් අවුරුදු සවස් කාල පංති**

ඉහත සඳහන් පංතියට ඇතුල් වීම සඳහා ඉල්ලුම් පත්‍ර 1960ක්වූ ජූලි මස 22 වැනි දින පස්වරු 4.30 දක්වා ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ විද්‍යාලයාධිපති තැන විසින් භාරගනු ලැබේ.

මේ පංතියට ඇතුල්වීමට අපේක්ෂා කරන අය ඉංග්‍රීසි භාෂාමය ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ගණිතය විෂයයක් හැටියට ඇතුව හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළත්ව විෂයයන් හයකින් හෝ සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

1960ක්වූ ජූලි මස 18 වැනි සඳු දින පස්වරු 4.30 දක්වා ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ විද්‍යාලයාධිපති තැනගෙන් ලබාගත හැකි නියමිත ඉල්ලුම් පත්‍රයේ ලියා එවිය යුතුයි. ඉල්ලුම් පත්‍රයෙහි රුපියල් දෙකක මුද්දරයක් අලවා ඒ මත අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුයි. ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් උපදෙස් අනුව මනා පරෙස්සමෙන් ඉල්ලුම් පත්‍රය පිරවිය යුතුයි. අසම්පූර්ණ හෝ වැරදි ලෙස පුරවන ලද හෝ නියමිත වටිනා කමට අඩු මුද්දර අලවන ලද හෝ වැරදි ෆෝර්ම පාවිච්චි කරන ලද හෝ නියමිත දිනට පසුව ලැබී ඇති සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එල්. එච්. සුමනදාස,
වැඩ බලන රෙජිස්ත්‍රාර්

1960 ක්වූ ජූලි මස 28 වැනි දින,
කොළඹ, ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේදීය.

---

එන්. එම්. යුසූෆ් මහතා 1960 මාර්තු මාසයේදී ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා පවත්වන ලද ද්විතීය කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ බැව් මෙයින් නිවේදනය කරමි.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූලි 1 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය : 573,
කොළඹ 12.

අංකය : 1/23/2/8(ජී)

## සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය

1959 නොවැම්බර් 21 වැනි දින පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින්, සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ 2 වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අදිකාරි, ඩී. එම්. | ආණ්ඩුවේ වැඩ |
| අන්නලිංගම්, පී. | යාපනේ කච්චේරිය |
| අන්සාරි, සී. එම්. | ආහාර කොමසාරිස් |
| අප්පදුරෙයි, වී. | සමාජ සේවා |
| අපූර්වසිංහම්, ටී. | වාරිමාර්ග |
| අබ්දුල් වාහිඩ්, අයි. එල්. | මහනුවර දිස්ත්‍රික් උසාවිය |
| අබේරත්න, එස්. එම්. | කෑගළු කච්චේරිය |
| අබේවර්ධන, ටී. එස්. | සමාජ සේවා |
| අබේවික්‍රම, එස්. | අධිකරණ අමාත්‍යංශය |
| අමරසේන, එම්. ඩී. | කළුතර කච්චේරිය |
| අයියදුරෙයි, ඊ. | ආණ්ඩුවේ වැඩ |
| අරසකුංගම්, එස්. | පළාත් පාලන |
| අරුමයිතුරෙයි, එස්. | සමාජ සේවා |
| අරුලානන්දම්, කේ. | කම්කරු |
| අලහකෝන්, පී. එන්. | කෘෂිකර්ම |
| අලහේසන්, වී. එස්. | කර්මාන්ත |
| අසන්, එස්. ඒ. | අලෙවිකිරීමේ |
| ආනන්දරාජු, වී. | පෝට් කොමිෂන් |
| ආරියපාල, එල්. එම්. | කොළඹ පිස්කල් කාර්යාලය |
| ආරියපාල, ටී. ඩබ්ලිව්. | ඉඩම් නිරවුල් කිරීමේ |
| ආරියරත්නම්, ටී. ඒ. | නුවරඑළිය කච්චේරිය |
| ආරියසේන, ඩී. කේ. | රත්නපුර කච්චේරිය |
| ආරුමුගම්, කේ. | පළාත් පාලන |
| ඇන්ඩර්සන්, එල්. ජී. | සෞඛ්‍ය |
| ඇන්තනි, කේ. එම්. | මහා භාණ්ඩාගාරය |
| ඉන්ද්‍රලිංගම්, කේ. | මහා භාණ්ඩාගාරය |
| ඉල්යාස්, එස්. එම්. එම්. | මහා භාණ්ඩාගාරය |
| උපසේන, එච්. එම්. | අධ්‍යාපන |
| එහම්පරම්, එස්. | යාපනේ කච්චේරිය |
| ඒකනායක, එල්. අබයසිංහ | අධ්‍යාපන |
| ඔස්ර්ස්, එස්. ටී. | මඩකලපුව කච්චේරිය |
| කතිරවේලු, එම්. | ආණ්ඩුවේ වැඩ |
| කදිරවේලු, කේ. ඒ. | අධ්‍යාපන |
| කන්දස්වාමි, එස්. කේ. | වාරිමාර්ග |
| කන්දසාමි, එම්. | අධ්‍යාපන |
| කන්දසාමි, කේ. | තක්සේරු |
| කන්නන්ගර, ඩබ්ලිව්. | අධ්‍යාපන |
| කනගසබාපති, එම්. | සෞඛ්‍ය |
| කනපතිපිල්ලෙයි, ඊ. | ඔඩිට් |
| කනපතිපිල්ලෙයි, එස්. | රාජකීය ලංකා නාවික හමුදාව |
| කර්තිගේසු, ඒ. | පළාත් පාලන |
| කරුණාතිලක, එම්. එම්. | කැලෑ |
| කල්දේරා, එච්. එස්. | අධ්‍යාපන |
| කලුආරච්චි, ඩබ්ලිව්. එන්. | සෞඛ්‍ය |
| කාරියවසම්, එච්. ජී. එෆ්. එස්. | වෙළඳ ද්‍රව්‍ය මිළයට ගැනීමේ |
| කුමාරසිංගම්, වී. | දේශීය ආදායම් |
| කුරේ, පී. එල්. ටී. බී. | රෙජිස්ත්‍රාර් ජෙනරාල් |
| කුරුනේරු, ඒ. | හම්බන්තොට කච්චේරිය |
| කුලතුංග, පී. | පොලිස් |
| කුලසේන, ටී. එච්. | කෘෂිකර්ම |
| කොටුවගේ, මාර්ටින් | අධ්‍යාපන |
| කොඩිකාර, එම්. | අධ්‍යාපන |
| කොහොඹන්ගේ, ඩී. | ගාළු කච්චේරිය |
| කෝඩීස්වරන්, සී. | ත්‍රිකුණාමලේ කච්චේරිය |
| ගම්ලත්, ඩී. බී. | අනුරාධපුර කච්චේරිය |
| ගල්හේන, ඩී. පී. | අධ්‍යාපන |
| ගිනිගේ, කේ. | සෞඛ්‍ය |
| ගුණතිලක, එම්. ඩී. චන්ද්‍රදාස | අධ්‍යාපන |
| ගුණතිලක, එම්. ඩී. චන්ද්‍රප්‍රේම | අධ්‍යාපන |
| ගුණදාස, කේ. ඩී. | ආණ්ඩුවේ වැඩ |
| ගුණවර්ධන, එල්. ඩී. බී. | රෙජිස්ත්‍රාර් ජනරාල් |
| ගුණවර්ධන, ඒ. පී. සී. වයි. ද වාස් | ඔඩිට් |
| ගුණසේකර, එස්. ද එස්. | ණය මණ්ඩලය |
| ගුණසේකර, ඩබ්ලිව්. | මහා භාණ්ඩාගාරය |
| ගුණසේන, ජී. එච්. | රෙජිස්ත්‍රාර් ජෙනරල් |
| ගුනම්, කේ. | දේශීය ආදායම් |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ගෝපාල ක්‍රිෂ්ණන්, වී. | සෞඛ්‍ය |
| ගෝවින්ද පිල්ලෙයි, කේ. | රජයේ මුද්‍රණාලය |
| චන්ද්‍රදාස, එස්. පී. | ජනසතු සේවා, නැව් හා ගමනාගමන අමාත්‍යංශය |
| චන්ද්‍රසිංහ, කේ. ඒ. | අධ්‍යාපන |
| චන්ද්‍රසේකර, ආර්. | අධ්‍යාපන |
| චන්ද්‍රසේකර, එල්. බී. | වාරිමාර්ග |
| චෙල්ලය්‍යා, පී. එම්. | ආහාර කොමසාරිස් |
| චෙල්ලය්‍යා, වේලවිතම්පිල්ලෙයි | පොලිස් |
| ජයතිලක, ඒ. ජී. | ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය |
| ජයතිලක, කේ. ජේ. | පොලිස් |
| ජයතිලක, ජී. එම්. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| ජයතිලක, එච්. එම්. පී. | කෑගල්ල කච්චේරිය |
| ජයවර්ධන, පී. ඒ. එස්. ඩබ්ලිව්. | ආහාර, වාණිජ හා වෙළඳ අමාත්‍යංශය |
| ජයවර්ධන, එස්. ඒ. | රත්නපුර කච්චේරිය |
| ජයවර්ධන, එස්. එස්. එම්. | ඔඩිට් |
| ජයසිංහ, ඒ. එම්. එම්. | ආණ්ඩුවේ වැඩ |
| ජයසිංහ, කේ. | රත්නපුර කච්චේරිය |
| ජයසිංහ, ජී. | දේශීය ආදායම් |
| ජයසේකර, කේ. ජේ. ටී. පී. | ආණ්ඩුවේ ගබඩා |
| ජයසේකර, එල්. එන්. ඩබ්ලිව්. | රත්නපුර කච්චේරිය |
| ජයසේකර, එච්. සී. සී. | ගොවිජන සේවා |
| ජයසේන, ඒ. කේ. බී. | මහා භාණ්ඩාගාරය |
| ජාතිසිංහ, එන්. යූ. | කොළඹ පිස්කල් කාර්යාලය |
| ජීවානන්දම්, ඩී. කේ. | ඔඩිට් |
| ජෙයරාජා, ඒ. ඩී. | අධ්‍යාපන |
| ජෝසප්, ආර්. | පොලිස් |
| ඥානසේගරම්, කේ. | සෞඛ්‍ය අමාත්‍යංශය |
| ටයිටස්, වයි. ජී. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| ඩැනී, කේ. ඩී. | අනුරාධපුර දිස්ත්‍රික් උසාවිය |
| තන්ගරාජා, ඩබ්ලිව්. එස්. | අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ග්‍රන්ථ ප්‍රකාශක මණ්ඩලය |
| තනගවේලුමුදලි, එස්. එම්. | සෞඛ්‍ය |
| තනබාලසිංහම්, සී. | සෞඛ්‍ය |
| තනසිංගම්, ටී. | මහා භාණ්ඩාගාරය |
| තනසිංහම්, ටී. | මහා භාණ්ඩාගාරය |
| තම්බයියා, කේ. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| තම්බිපිල්ලෙයි, එම්. | ඇටෝර්නි ජනරාල් |
| තම්බිරාජා, ඒ. | ඉඩම් සංවර්ධන |
| තර්මලිංගම්, එම්. | ආහාර කොමසාරිස් |
| තියාගරාජන්, එම්. | ආණ්ඩුවේ වැඩ |
| තිරිමාන්න, එච්. සී. ජේ. බී. | විදුලි කර්මාන්ත |
| තිරුවිලන්ගම්, කේ. | ආණ්ඩුවේ වැඩ |
| තිල්ලයම්පලම්, කේ. | පොලිස් |
| තිලකරත්න, කේ. ඒ. | අධ්‍යාපන |
| තිසවීරසිංහ, ඊ. එම්. එම්. | සෞඛ්‍ය |
| තියේරා, සී. ජී. | මහා භාණ්ඩාගාරය |
| තුරෙයිරාජා, එස්. | විදුලි කර්මාන්ත |
| තුරෙයිරාජා, පී. | යාපනේ කච්චේරිය |
| තුරෙයිසිංහම්, කේ. | පොලිස් |
| තුෂ්යන්තන්, එස්. එන්. | අලෙවි කිරීමේ |
| තෙඩ්වනමූර්ති, එස්. | දේශීය ආදායම් |
| තෙන්නකෝන්, එස්. සී. | හලාවත දිස්ත්‍රික් උසාවිය |
| තේගරාසා, එම්. | දේශීය ආදායම් |
| තේවරත්නම්, ටී. | මහා භාණ්ඩාගාරය |
| තේවසිගාමනි, ටී. | කැලෑ |
| තොටගමුව, එල්. ටී. | ඉඩම් කොමසාරිස් |
| දන්තනාරායන, එස්. | අධ්‍යාපන |
| දන්වත්ත, බී. | සෞඛ්‍ය |
| දයාවන්ස, ඒ. ජී. | සෞඛ්‍ය |
| දලුවත්ත, එච්. | ඔඩිට් |
| ද සිල්වා, ආර්. එස්. | පොලිස් |
| ද සිල්වා, එන්. සී. ඩබ්ලිව්. | මෝටර් රථ ගමනාගමන |
| ද සිල්වා, එම්. එච්. ජේ. පී. | ආණ්ඩුවේ වැඩ |
| ද සිල්වා, එම්. ඩී. | කොළඹ පිස්කල් කාර්යාලය |
| ද සිල්වා, එම්. බී. | සෞඛ්‍ය |
| ද සිල්වා, එස්. ටී. ජී. | වාරිමාර්ග |
| ද සිල්වා, ජී. ජී. ඩී. | දේශීය ආදායම් |
| ද සිල්වා, ඩබ්ලිව්. එම්. වී. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| ද සිල්වා, ඩබ්ලිව්. කේ. ජේ. | අධ්‍යාපන |
| ද සිල්වා, ඩී. එල්. පී. | ආණ්ඩුවේ වැඩ |
| ද සිල්වා, සී. අයි. | පළාත් පාලන |
| ද සොයිසා, ටී. ටී. ඒ. | ඉඩම් කොමසාරිස් |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ද සොයිසා, බී. ජේ. | ගාල්ල කච්චේරිය |
| දිසානායක, පී. | ගාල්ල කච්චේරිය |
| දේවේන්ද්‍රරාජා, ඒ. | කම්කරු |
| ධර්මසේන, ටී. එච්. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| ධීරසේන, බී. එච්. | මහා භාණ්ඩාගාරය |
| නඩේසසබාපති සර්මා, ටී. | රාජකීය ලංකා නාවික හමුදාව |
| නඩරාජා, එස්. කේ. | පළාත් පාලන |
| නඩරාජා, කේ. | රාජ්‍ය භාෂා |
| නඩරාජාර්, කේ. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| නඩරාජා, එන්. | වවුනියා කච්චේරිය |
| නඩරාජා, එම්. | කැලෑ |
| නඩරාජා, ටී. | ආණ්ඩුවේ වැඩ |
| නඩරාජා, වී. | පෝට් කොමිෂන් |
| නඩරාසා, එස්. | දේශීය ආදායම් |
| නඩේසන්, වී. | ඔඩිට් |
| නන්දසිරි, එස්. ඒ. ඩී. | තැපැල්, වැඩ සහ විදුලිබල |
| නන්දසේන, ශ්‍රී. ඩබ්ලිව්. | ඔඩිට් |
| නමසිවායම්, එස් | කොළඹ කච්චේරිය |
| නාවරත්න, ජේ | ගොවිජන සේවා |
| නවරත්නම්, එස්. එස්. | ත්‍රිකුණාමල කච්චේරිය |
| නවරත්නම්, ඒ. | පොලිස් |
| නවරත්නම්, පී. | වාරිමාර්ග |
| නවරත්න, පී. එම්. | කෘෂිකර්ම |
| නවරත්නම්, වී. | කැලෑ |
| නවරතිනම්, එන්. | වවුනියා කච්චේරිය |
| නාගෙන්තිරම්, වී. | ආණ්ඩුවේ වැඩ |
| නානායක්කාර, ජේ. ඩී. එන්. ආර්. | ආණ්ඩුවේ වැඩ |
| නානායක්කාර, ඩී. ටී. එජ්. | සෞඛ්‍ය |
| නාමසිවායම්, ආර්. එම්. | කොළඹ කච්චේරිය |
| නාමසිවායම්, එම්. | ධීවර |
| නාමසිවායම්, කේ. | රාජකීය ලංකා නාවික හමුදාව |
| නිතියනන්දවේල්, එස්. | යාපනේ කච්චේරිය |
| නෙලුන්දෙනිය, එච්. බී. | මාතලේ කච්චේරිය |
| පත්මනාතන්, කේ. | සෞඛ්‍ය |
| පත්මනාතන්, එස්. | කුරුණෑගල කච්චේරිය |
| පත්මනාතන්, එස්. | වාරිමාර්ග |
| පත්මනාපන්, එම්. | සෞඛ්‍ය |
| පද්මනාතන්, එන්. එස්. | ආණ්ඩුවේ වැඩ |
| පන්වලිංගම්, එස්. | ආණ්ඩුවේ වැඩ |
| පන්වලිංගම්, සී. | සෞඛ්‍ය |
| පන්චාඩ්චරම්, ටී. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| පරමනන්තම්, එස්. | සෞඛ්‍ය |
| පරමලිංගම්, ටී. | කැලෑ |
| පරමසිවම්, කේ. | විදුලි කර්මාන්ත |
| පරමේස්වරන්, වී. | යාපනේ කච්චේරිය |
| පාලරත්නම්, කේ. | අනුරාධපුර කච්චේරිය |
| පාලසිංහම්, එස්. | කෑගල්ල කච්චේරිය |
| පාලේන්තිරන්, එන්. | ඔඩිට් |
| පැටර්සන්, එච්. ඒ. | මඩකලපුව කච්චේරිය |
| පියතිස්ස, එම්. පී. | සෞඛ්‍ය |
| පිරිස්, ආර්. එස්. | ආගමන හා විගමන |
| පිරිස්, ඩබ්ලිව්. ටී. | අධ්‍යාපන |
| පුන්චි බණ්ඩා, ජී. ඕ. | මහනුවර කච්චේරිය |
| පුෂ්පනාතන්, ඒ. | සෞඛ්‍ය |
| පෙතන්ගොඩ, ඩබ්ලිව්. | කොළඹ කච්චේරිය |
| පෙම්මාවඩු, එස්. ඩී. | ඔඩිට් |
| පෙරේරා, ඕ. එස්. | පෝට් කොමිෂන් |
| පෙරේරා, කේ. එන්. ඩී. | ඔඩිට් |
| පෙරේරා, ජේ. සී. සී. | සෞඛ්‍ය |
| පෙරේරා, පී. ඒ. එස්. | හම්බන්තොට කච්චේරිය |
| පෙරේරා, පී. කේ. | අධ්‍යාපන |
| පෙරේරා, එම්. ඒ. | අධ්‍යාපන |
| පෙරේරා, ආර්. ඊ. | කෘෂිකර්ම |
| පෙරේරා, එල්. බී. | පොලිස් |
| පෙරේරා, එස්. | ඔඩිට් |
| පෙරේරා, එස්. ජී. | අධ්‍යාපන |
| පෙරේරා, එච්. එස්. | අධ්‍යාපන |
| පේමදාස, බී. ඩී. | සමුපකාර |
| ප්‍රේමරත්න, කේ. ඒ. | මහනුවර කච්චේරිය |
| පේරම්පලම්, එන්. | ධීවර |
| පොන්නම්බලම්, ආර්. | ආනයන හා අපනයන |
| පෝල්, ජේ. ඒ. | නීති කෙටුම්පත්කරු |
| ෆොන්සේකා, සී. සී. | මහා භාණ්ඩාගාරය |
| ප්‍රනාන්දු, ඒ. එන්. | ඇටෝර්නි ජනරාල් |
| ප්‍රනාන්දු, බී. වී. කේ. | දේශීය ආදායම් |
| ප්‍රනාන්දු, වී. ඊ. | බදුල්ල කච්චේරිය |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ප්‍රනාන්දු, යු. ඒ. ඕ. | ඔඩිට් |
| ප්‍ර··න්දු, ආර්. ජී. | සෞඛ්‍ය |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. ඒ. බී. | අල්ලස් කොමසාරිස් |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. ජේ. පී. | දේශීය ආදායම් |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. බී. ජේ. | සුරාබදු |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. බී. එස්. | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| ප්‍රනාන්දු, එස්. ජේ. ඩී. | අධ්‍යාපන |
| ප්‍රේමචන්ද්‍ර, වී. වී. | පොලිස් |
| ප්‍රේමවර්ධන, ආර්. බී. | සුරාබදු |
| බස්තියම්පිල්ලෙයි, ජේ. එස්. | දේශීය ආදායම් |
| බාලසුබ්‍රමනියම්, එස්. | ගොවිජන සේවා |
| බාලසුබ්‍රමනියම්, කේ. | යාපනේ පිස්කල් කාර්යාලය |
| බාලසුබ්‍රමනියම්, කේ. | වාරිමාර්ග |
| බාලසුබ්‍රමානියම්, වී. | ආණ්ඩුවේ වැඩ |
| බුද්ධදාස, එම්. | මහා භාණ්ඩාගාරය |
| බෙනඩික්ට්, කේ. ඊ. | වවුනියා කච්චේරිය |
| බොතේජු, ඩබ්ලිව්. ටී. | සෞඛ්‍ය |
| බෝල්ටන් සිල්වා, ඒ. | සුරාබදු |
| මණ්ඩාවල, ඩී. ටී. | ආණ්ඩුවේ වැඩ |
| මනම්පේරි, එස්. ඒ. | ගොවිජන සේවා |
| මයිල්වාගනම්, ටී. | තක්සේරු |
| මරියදාස, ජී. | මන්නාරම් කච්චේරිය |
| මහාතේවන්, එස්. | මහා භාණ්ඩාගාරය |
| මහාදේවන්, එන්. | කර්මාන්ත |
| මහාරත්නම්, කේ. | යාපනේ කච්චේරිය |
| මානික්කවාසගම්, කේ. | ආණ්ඩුවේ වැඩ |
| මාර්කන්ඩු, ටී. | වාරිමාර්ග |
| මාරිමුත්තු, කේ. | ත්‍රිකුණාමල දිස්ත්‍රික් උසාවිය |
| මැදගොඩ, එච්. එම්. ඩබ්ලිව්. බී. | ගොවිජන සේවා |
| මිල්ලපිටියේ, එම්. ඒ. ජේ. | නුවරඑළිය කච්චේරිය |
| මුත්තයියා, එම්. | මහනුවර කච්චේරිය |
| මුතුතම්බි, ඒ. | සුරාබදු |
| මුනසිංහ, එම්. ඒ. ඒ. | පුරාවිද්‍යා |
| මුනසිංහ, වී. එල්. | වාරිමාර්ග |
| මුනිදාස, ඩී. | අධ්‍යාපන |
| මුරුගේසපිල්ලෙයි, පී. | වාරිමාර්ග |
| මොහමඩ් සිඩීක්, ඒ. එස්. | විදුලි කර්මාන්ත |
| යසපාල, එච්. ඩී. | ගොවිජන සේවා |
| රණවරන, එස්. බී. | වාරිමාර්ග |
| රණවීර, ටී. ඒ. එස්. | මුදල් අමාත්‍යාංශය |
| රණසිංහ, සිරිසේන | අධ්‍යාපන |
| රත්නපාල, එස්. ඩබ්ලිව්. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| රත්නසිරි, කේ. එස්. | පෝට් කොමිෂන් |
| රත්නායක, ඊ. එම්. | මහනුවර කච්චේරිය |
| රත්දෙනිය, පී. බී. | කෘෂිකර්ම |
| රනතුංග, ජේ. ඒ. ඩී. | ගම්පහ දිස්ත්‍රික් උසාවිය |
| රනවන, ඊ. ඒ. ආර්. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| රනවීර, ටී. සී. | ඔඩිට් |
| රනසිංහ, ඒ. ඊ. පී. | ආගමන හා විගමන පාලක |
| රනසිංහ, ඩී. ඩී. | දේශීය ආදායම් |
| රසරත්නම්, එස්. | විදුලිබල |
| රාජතුරෙයි, ඒ. අයි. | ආණ්ඩුවේ වැඩ |
| රාජදුරෙයි, එස්. | ඔඩිට් |
| රාජනායගම්, ඒ. | ලංකා යුද්ධ හමුදාව |
| රාජපක්ෂ, එච්. එල්. ටී. | ප්‍රවෘත්ති |
| රාජලිංගම්, එන්. | අධ්‍යාපන |
| රාජා, කේ. එන්. | ආණ්ඩුවේ ගබඩා |
| රාජේන්ද්‍රම්, කේ. | දේශීය ආදායම් |
| රාමචන්ද්‍ර, පී. යු. | පොලිස් |
| රාමචන්ද්‍රන්, වී. | ඔඩිට් |
| රාමනාතන්, ඒ. | ආණ්ඩුවේ ගබඩා |
| රාමනායක, ජී. ජේ. එන්. ඩබ්ලිව්. | පොලොන්නරුව කච්චේරිය |
| රාමනායක , ආර්. පී. ඩී. | දේශීය ආදායම් |
| රුද්‍රා, කේ. | යාපනේ කච්චේරිය |
| රුද්‍රිගු, එල් ඩී. ඊ. ඒ. | කොළඹ කච්චේරිය |
| රුද්‍රිගු, වී. ඒ. ආර්. ආර්. | ඔඩිට් |
| ලියනගෙදර, යු. බී. | මහනුවර කච්චේරිය |
| ලියනගේ, පී. | ආණ්ඩුවේ වැඩ |
| වනසිංහ, පී. ඒ. | අධ්‍යාපන |
| වනසිංහ, ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. | වාරිමාර්ග |
| වර්ධරාජා, එස්. | ආණ්ඩුවේ වැඩ |
| වික්‍රමනායක, ඩී. ටී. | අධ්‍යාපන |
| වික්‍රමසිංහ, ඩබ්ලිව්. ඩී. ඒ. පී. එච්. | පොලොන්නරුව කච්චේරිය |
| වික්‍රමසිංහ, එච්. ආර්. | දේශීය ආදායම් |
| වික්‍රමාරච්චි, ජී. | අධ්‍යාපන |
| විජයතිලක, පී. බී. | ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත |
| විජයවික්‍රම, ටී. ජේ. එස්. | ඔඩිට් |
| විජයසුන්දරම්, ඒ. | සිවිල් ගුවන් සේවා |
| විජේරත්න, එම්. කේ. | මහනුවර කච්චේරිය |
| විජේරත්න, එම්. ඩබ්ලිව්. එස්. | කොළඹ පිස්කල් කාර්යාලය |
| විජේරත්න, ඩබ්ලිව්. එම්. | සමුපකාර |
| විජේරත්න, එච්. කේ. | කොළඹ කච්චේරිය |
| විජේසිංහ, එම්. ඒ. බී. | කෑගල්ල මහේස්ත්‍රාත් උසාවිය |
| විජේසිංහ, එච්. බී. | ආණ්ඩුවේ වැඩ |
| විතාන, ආර්. එන්. | ඉඩම් සංවර්ධන |
| විතානාරච්චි, එන්. ජේ. | වාරිමාර්ග |
| විනායගමූර්ති, ඒ. | ඇටෝර්නි ජනරාල් |
| විමලදාස, ඒ. ඩබ්ලිව්. ඩබ්ලිව්. | මහනුවර කච්චේරිය |
| විමලරත්න, ඊ. ඩී. සී. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| විමලසුන්දර, සී. ඊ. | පොලිස් |
| විමලසේන, කේ. එෆ්. | අධ්‍යාපන |
| විවේකානන්දන්, එස්. | කෘෂිකර්ම |
| වීරගති, කේ. | විදුලි කර්මාන්ත |
| වීරසිංහ, එෆ්. | ගාල්ල කච්චේරිය |
| වීරසිංහ, එස්. | අධ්‍යාපන |
| වීරසේකර, එම්. | වාරිමාර්ග |
| වීරසේකර, ඩබ්ලිව්. එම්. එච්. බී. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| වෙට්ටිවේලු, කේ. | ආණ්ඩුවේ වැඩ |
| වෙල්ලාබල, එෆ්. | ඛනිජ |
| වේලවුතපිල්ලෙයි, එස්. | පොලිස් |
| වේලායුතන්, වී. | සෞඛ්‍ය |
| වේලායුතපිල්ලෙයි, එම්. | ආහාර කොමසාරිස් |
| වේලායුතම්, ටී. | වාරිමාර්ග |
| වේලායුදපිල්ලේ, ආර්. | කම්කරු |
| වේලුප්පිල්ලේ, කේ. | තේ පිටරට යැවීමේ |
| වේලුපිල්ලෙයි, එස්. | ජාතික නිවාස |
| වේලුපිලෙයි, වී. වී. | ආණ්ඩුවේ වැඩ |
| වේලුම්මයිලම්, වී. | කෑගල්ල මහේස්ත්‍රාත් උසාවිය |
| වෛද්‍යරත්න, කේ. ඩබ්ලිව්. ජී. | අධ්‍යාපන |
| වෛද්‍යසේන, එම්. එච්. | ගොවිජන සේවා |
| ශිවලිංගම්, වී. | ත්‍රිකුණාමල කච්චේරිය |
| ෂන්මුගනාතන්, පී. | ඔඩිට් |
| ෂන්මුගලිංගම්, කේ. | දේශීය ආදායම් |
| ෂරීෆ්, එම්. එල්. එම්. | ආණ්ඩුවේ ගබඩා |
| ස්ටැනිස්ලෝස්, එච්. එස්. ජේ. | ඔඩිට් |
| සත්තියපාල, ටී. ඩබ්ලිව්. | කොළඹ කච්චේරිය |
| සතරකුලසිංහ, කේ. එෆ්. ඊ. ජේ. | පුත්තලම් කච්චේරිය |
| සතානන්තන්, කේ. | පොලිස් |
| සතානන්තන්, එස්. | දේශීය ආදායම් |
| සතාසිවම්, එන්. | ආණ්ඩුවේ ගබඩා |
| සන්තිරසේගරම්, ඊ. | යාපනේ කච්චේරිය |
| සන්තිරසේගරම්, ටී. | කුරුණෑගල කච්චේච්රිය |
| සන්මුගනාතන්, ටී. | මහා භාණ්ඩාගාරය |
| සන්මුගනාතන්, ටී. | යාපනේ කච්රෙිය |
| සන්මුගසුන්තරම්, කේ. | කම්කරු |
| සබනාතන්, එස්. | දේශීය ආදායම් |
| සබාරත්නම්, ඒ. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| සමරපති, ඩී. | කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය |
| සමරසිංහ, කේ. බී. | කොළඹ ඒකාබද්ධ මහේස්ත්‍රාත් උසාවිය |
| සමරසේන, ආර්. | මහා භාණ්ඩාගාරය |
| සරවනපාවම්, වී. ටී. | බ්‍රසීලයේ ලංකා තානාපති කාර්යාලය |
| සහිඩ්, ඒ. එම්. එම්. | ඔඩිට් |
| සිකුරාජපති, බී. ඩබ්ලිව්. | ආනයන හා අපනයන පාලක |
| සිතම්පරනාතන්, ඊ. | යාපනේ කච්චේරිය |
| සිතම්පරනාකන්, කේ. | ආහාර කොමසාරිස් |
| සිතම්පරපිල්ලෙයි, වී. | කෘෂිකර්ම |
| සින්නතම්බි, වී. | ඔඩිට් |
| සින්නතම්බි, වී. | සෞඛ්‍ය |
| සින්නතම්බි, සී. | අධ්‍යාපන |
| සින්නප්පු, එස්. | පොලිස් |

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

**ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ඉංග්‍රීසි)—1960වේ අප්‍රේල් මස**

වර්ෂ 1960 අප්‍රේල් මස 8 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2.940 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ආරියවර්ධන, ඩී. එස්. | නීති කෙටුම්පත්කරුගේ | ලඝු ලේඛනය |
| කාදර්, එම්. බී. එන්. ඒ. | රාජකීය ලංකා නාවික හමුදාව | ලඝු ලේඛනය |
| කාදරමන්, ජේ. පී. ජේ. | සෞඛ්‍ය | ලඝු ලේඛනය, රචනය සහ සිංහල |
| ජයසිංහ, පී. (මහත්මිය) | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් කාර්යාලය | ලඝු ලේඛනය |
| දල්පද්දු, කේ. ඩබ්ලිව්. වී. | කම්කරු | ලඝු ලේඛනය |
| ද සිල්වා, ඊ. සී. (මහත්මිය) | ලංකා කාර්මික විද්‍යාලයය | ලඝු ලේඛනය |
| ද සිල්වා, එච්. එල්. එස්. | දිස්ත්‍රික් උසාවිය, බලපිටිය | ලඝු ලේඛනය |
| ද සිල්වා, ඩී. බී. ජී. | මැතිවරණ | සිංහල |
| පෙරේරා, එම්. සී. බී. (මහත්මිය) | වාරිමාර්ග | රචනය |
| පෙරේරා, සී. එස්. | කම්කරු, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය | සිංහල |
| ප්‍රැන්සිස්, ඒ. | දිස්ත්‍රික් උසාවිය, බලපිටිය | ලඝු ලේඛනය |
| මැනුවෙල්, ජේ. බී. | දිස්ත්‍රික් උසාවිය, මඩකලපුව | දෙමළ |
| මුදන්නායක, එල්. පී. (මෙනවිය) | අධ්‍යාපන | රචනය සහ සිංහල |
| තාලිෆ්, එම්. එෆ්. එච්. | දිස්ත්‍රික් උසාවිය, කෑගල්ල | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ආරියවර්ධන, ඩී. එස්. | නීති කෙටුම්පත්කරුගේ |
| කාදරමන්, ජේ. පී. ජේ. | සෞඛ්‍ය |
| ද සිල්වා, ඊ. සී. (මහත්මිය) | ලංකා කාර්මික විද්‍යාලයය |
| ද සිල්වා, එච්. එල්. එස්. | දිස්ත්‍රික් උසාවිය, බලපිටිය |
| ද සිල්වා, ඩී. බී. ජී. | මැතිවරණ |
| පෙරේරා, සී. එස්. | කම්කරු, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය |
| ප්‍රැන්සිස්, ඒ. | දිස්ත්‍රික් උසාවිය, බලපිටිය |
| තාලිෆ්, එම්. එෆ්. එච්. | දිස්ත්‍රික් උසාවිය, කෑගල්ල |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව ද, එම පරීක්ෂණයට ඇතුළත්වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස්වරයා වෙත ලියා පදිංචි කළ තැපැලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක් වූ ජූලි මස 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

**ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතාකඩඉම් පරීක්ෂණය— (ඉංග්‍රීසි)**

ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වර්ෂ 1960 ක් වූ මැයි මස 17 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝු ලේඛකයන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි. ඔව්හු යථෝක්ත කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථය ලැබීමට දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| කුරේ, පී. ඩබ්ලිව්. බී. | දිස්ත්‍රික් උසාවිය, කළුතර |
| ජයසිරිවර්ධන, ඩී. ඩී. ඩබ්ලිව්. ඩී. | දේශීය ආදායම් |
| විජේසිංහ, කේ. බී. | මැතිවරණ |
| සිරිල්, ජේ. ඊ. ඒ. | පොලිස් |
| හෙට්ටිආරච්චි, ඒ. වී. | දිස්ත්‍රික් උසාවිය, කොළඹ |

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ ජූලි මස 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

**ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) පරීක්ෂණය—1960 වේ අප්‍රේල් මස**

වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 8 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත්ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන්කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| අඟනාවෙල, එම්. එම්. (මහත්මිය) | මුදල් අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| අතුකෝරල, සී. ජී. එම්. (මහත්මිය) | කර්මාන්ත | ලඝු ලේඛනය |
| අබේවර්ධන, එන්. එස්. එම්. (මහත්මිය) | කම්කරු | ඉංග්‍රීසි සහ සිංහල |
| ඉබ්‍රහිම්, ඉසැඩ්. එම්. | කච්චේරිය, නුවරඑළිය | ඉංග්‍රීසි සහ දෙමළ |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| එහම්බරම්, වී. | කච්චේරිය, ත්‍රිකුණාමලය | ඉංග්‍රීසි සහ දෙමළ |
| ඒකනායක, වී. එච්. ඒ. | කම්කරු | ඉංග්‍රීසි |
| ගයිනන්, එච්. ඊ | ගුවන් විදුලි | ඉංග්‍රීසි |
| ඩයස්, එම්. එල්. බී. | ගුවන් විදුලි | ඉංග්‍රීසි සහ සිංහල |
| ඩේවිඩ්, ඩී. එස්. පී. (මෙනවිය) | සෞඛ්‍ය | ඉංග්‍රීසි සහ සිංහල |
| දිසානායක, , ඩී. සෙන්ට්. සී. | විභාග | සිංහල |
| පීරිස්, ජේ. ඩබ්ලිව්. | අධිකරණ අමාත්‍යාංශය | ඉංග්‍රීසි |
| ප්‍රනාන්දු, එම්. ආර්. බී. (මෙනෙවිය) | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ඉංග්‍රීසි |
| ප්‍රනාන්දු, බී. ජී. සී. | දිස්ත්‍රික් උසාවිය, හලාවත | ඉංග්‍රීසි සහ සිංහල |
| මෝර්ටිමර්, එල්. එස්. | කර්මාන්ත | ලඝු ලේඛනය |
| සහබදීන්, එම්. එම්. | කෘෂිකර්ම | ඉංග්‍රීසි සහ සිංහල |

2. පහත සඳහන් අපේක්ෂකයන් පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දැන් සමර්ථ වී ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අඟුනාවෙල, එම්. එම්. (මහත්මිය) | මුදල් අමාත්‍යාංශය |
| අකුකෝරල, සී. ජී. එම්. (මහත්මිය) | කර්මාන්ත |

වර්ෂ 1960 ක් වූ ජූලි මස 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

---

මගේ අංකය : ඊ.බී.ඒ 21/59.

## ආරෝග්‍යශාලා ලිපිකරුසේවා විභාගය—සැප්තැම්බර් 1959

අංක 12,092 සහ 1960 මාර්තු 15 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රයේ පළවූ 1960 මාර්තු 16 වැනි දින දරන නිවේදනය සහ අංක, 12,125 සහ 1960 මැයි 6 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රයෙහි පළවූ 1960 අප්‍රියෙල් 27 වැනි දින දරන නිවේදනයන්ට අතිරේක වශයෙන් පහත නම් සඳහන් අපේක්ෂකයන් ද 1959 සැප්තැම්බර් මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව ආරෝග්‍යශාලා ලිපිකරුසේවයේ II වැනි පෙළ පත්වීම් දීම සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | ලිපිනය |
|---|---|
| අබේසිංහ, ඇල්. ඇස්. | "මංගල", නාඔටුන්න, කැකනඳුර. |
| අමරකෝන්, ඒ. ඩී. ඩබ්ලිව්. | කනත්තවත්ත, හෙයියන්තුඩුව. |
| දිසානායක, ශූ. බී. | "විජයගිරි" යාලෙගොඩ, හන්දෙස්ස. |
| ජෝගන්දන්දවේල්, වී. | වේදන් පටුමාවත, වෙල්වෙට්තුරෙයි. |
| කන්දසාමි, ඇස්. | නො. 5, කොට්ඨාශය, වේලනයි, නැගෙනහිර, වේලනයි. |
| කරුණාරත්න, එච්. ඇම්. | පානිගොඩගෙදර, වඩුමුනෙගෙදර. |
| ලීලදාස, ඇම්. පී. | නෙවිසියගහවත්ත, කයිකාවල, ඉඳුරුව. |
| ලියනපතිරන, ජී. ඇස්. ඒ. | 502, ගාලු පාර, කොල්ලුපිටිය, කොළඹ 3 වේගම, ගොකරැල්ල. |
| නවරත්න, ආර්. බී. | 335, ජනප්‍රිය මාවත, කොරළවැල්ල, මොරටුව. |
| පීරිස්, පී. ඇන්. ඇන්. | "පියවාස" බෝරල, වැලිගම. |
| පියසේන, ජේ. පී. | තෙන්නකුඹුර, ගුරුදෙනිය, නුවර. |
| රන්දුන්නෙ, ඇම්. බී. | 110, වීදියවත්ත, උඩුගම්පල. |
| රණසිංහ, ඇම්. පී. | වී. වෙල්ලයියා බාරේ, අවරන්ගල |
| සිවඥනම්, ඇස්. | පුතූර් ( පී. ඕ. ආර් ඩී. ඇස්. පටුමාවත) |
| සොමස්කන්ද, ඒ. | "රාවලායි" පුල්ලි බටහිර, පේදුරුතුඩුව. |

2. මෙම අපේක්ෂකයිනට රක්ෂාව සැපයීමට රජය බැඳී නැත. පුරප්පාඩු ඇතිවන අන්දමින් ඔවුනට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් අවුරුදු තුනක සෝදිසි කාලයකින් යුක්ත වන්නේ ය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතු ය. තව ද, ඔවුන් ආරෝග්‍යශාලා ලිපිකරුසේවය පිළිබඳ කොන්දේසි වලට යටත් විය යුත්තාහ.

ඩබ්ලිව්. ඒ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1960 ජූනි මස 24 වැනි දා.
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), 1960. 10. 1 දින සිට 1961. 9. 30 දින තෙක් හුණු සැපයීම සඳහා 1960 ජූලි 26 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරිතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූලි 25 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ශූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූලි 8 වැනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1.) 1960.10.1 වැනි දින සිට 1961.9.30 දින තෙක් ආණ්ඩුවේ නැව් බඩු ගෙනයාම සඳහා 1960 අගෝස්තු 9 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලබන්නේ ලාංකිකයින්ට සහ ලාංකික වෙළඳ සමාගම් වලට පමණයි.

ටෙන්ඩර් විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 300ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ එ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 අගෝස්තු 8 වැනි සඳුදා දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ශූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූලි 8 වැනි දින,
කොළඹදීය.

---

## 1960-61 මුදල් වර්ෂය තුළ කොළඹ (වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය,) මහනුවර (බෝගම්බර බන්ධනාගාරය, මහනුවර රිමාන්ඩ් බන්ධනාගාර) මහර සහ යාපනය බන්ධනාගාරවලට කෑම ද්‍රව්‍ය සැපයීම

කොළඹ (වැලිකඩ බන්ධනාගාර, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර, මැගසින් බන්ධනාගාර) මහනුවර (බෝගම්බර බන්ධනාගාරය, මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය) මහර සහ යාපනය යන බන්ධනා

ගාරවලට වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වර්ෂ 1961 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කැම ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් කැඳවනු ලැබේ.

2. ටැන්ඩර්කරුවන් මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ "වෙළඳ ද්‍රව්‍ය" වශයෙන් මිස "ආහාර" ක්‍රමයට නොවේ. ටැන්ඩර් ඉදිරිපත් කිරීමට කැමති යම් උපලේඛනයක හෝ උපලේඛනයන්හි ඉහත සඳහන් සියලුම විෂයයන් සඳහා "මිළ ගණන්" ඉදිරිපත් කළ යුතු ය. "අ" සිට "උ" දක්වා සඳහන් උපලේඛනයන්ගෙන් ඕනෑම එකකට හෝ වැඩි ගණනකට මිළ ගණන් ඉදිරිපත් කිරීමට පුළුවන. ඒ ඒ උපලේඛනය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් භාර ගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන්ගෙන් බලාගත යුතුයි.

උපලේඛනය : (අ)

පාන්
හුළං විස්කෝත්තු

උපලේඛනය : (ආ)

හරක් මස්
එළු මස්
ලිවර්
කුකුළු මස්
බිත්තර

උපලේඛනය : (ඇ)

නොයෙක් වර්ගයේ මාළු
නොයෙක් වර්ගයේ කරවල

උපලේඛනය : (ඈ)

පොල්
කැඹිලි

උපලේඛනය : (ඉ)

කුළු බඩු

උපලේඛනය : (ඊ)

එළවළු වර්ග සහ පළතුරු වර්ග
(අ) කොළ එළවළු
(ආ) පලතුරු එළවළු
(ඇ) පිටි සහිත එළවළු
(ඈ) අන්‍ය එළවළු

උපලේඛනය : (උ)

එළකිරි

3. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා, සීල් තබා සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය කියා එවිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපැලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ කොළඹ 7, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ඩබ්ලිව්. ජී. හඳගම මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "............ බන්ධනාගාරයට ............ උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා මෙහි 9 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30ට ප්‍රථම ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ එවිය යුතුය. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 9 වැනි වගන්තියේ සඳහන් වේලාවේදී කොළඹ 7, ටොරින්ටන් පෙදෙසේ පිහිටි ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාල යේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් ෆෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්තැනගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලැකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර් කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත්කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් විණි නම් එසේ නොහොත් එසේ කිරීමෙන් වැළැකී සිටී නම් තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නො හැකිවන සේ ඔහුගේ නම කොන්ත්‍රාත්තු කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවාට සිදුවනවා ඇත. මෙම අලාභ මුදල නීති මඟින් අය කර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් නැති නම් එහි ගෙන ගොස් භාරදුනහොත් එම නිවේදනය ලැබුණ ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

කොළඹ බන්ධනාගාරය :—

| උපලේඛනය | | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ශ. | | ඇප මුදල රු. | ශ. | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|---|---|---|---|
| අ | ... | 100 | 0 | ... | 300 | 0 | 1960 අගෝස්තු 2 වනදා උදය 10.30ට |
| ආ | ... | 100 | 0 | ... | 300 | 0 | |
| ඇ | ... | 100 | 0 | ... | 300 | 0 | |
| ඈ | ... | 100 | 0 | ... | 300 | 0 | |
| ඉ | ... | 100 | 0 | ... | 300 | 0 | |
| ඊ | ... | 100 | 0 | ... | 300 | 0 | |
| උ | ... | 100 | 0 | ... | 200 | 0 | |

(අ) මහනුවර බන්ධනාගාරය බෝගම්බර සහ මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය

1960 අගෝස්තු 3 වනදා උදේ 10.30ට

(ආ) මහර බන්ධනාගාරය. 1960 අගෝස්තු 4 වැනිදා උදේ 10.30ට

(ඇ) යාපනය බන්ධනාගාරය, 1960 අගෝස්තු 5 වැනිදා උදේ 10.30ට

| උපලේඛනය | | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ශ. | | ඇප මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) | ... | 100 | 0 | ...... | 200 | 0 |
| (ආ) | ... | 100 | 0 | ... | 200 | 0 |
| (ඇ) | ... | 100 | 0 | ... | 200 | 0 |
| (ඈ) | ... | 100 | 0 | ... | 200 | 0 |
| (ඉ) | ... | 100 | 0 | ... | 200 | 0 |
| (ඊ) | ... | 100 | 0 | ... | 200 | 0 |
| (උ) | ... | 100 | 0 | ... | 100 | 0 |

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලෙඛනය සඳහා තැන්පත් කරනු ලබන මුදල වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබා ගත යුතු බවත් ඉදිරිපත් කරන මිළ ගණන් ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත් එසේම, එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප විය හැකි බවත් ටෙන්ඩර් කරුවන්ගේ විශෙෂ සැළකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන වගට ඔවුන් වෙනුවෙන් ඇපකරුවන් වශයෙන් පෙනී සිටීමට කැමැති වග කිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට සුදුසු ඇප කරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 9 වැනි වගන්තියේ ප්‍රකාරය. අවශ්‍ය සියලු තොරතුරු මෙහි 6 වැනි වගන්තියේ සඳහන් කාර්යාල යෙන් ලබාගත හැක.

13. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නො මැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සළකා බලනු නො ලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළි නොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම් කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමෙකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක්, ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී තම සම්පූර්ණ නාම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම් දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද රපෝර්තුවක් එවිය යුතුය. දේපොළ විස්තරද සඳහන් කළ යුතුය.

දක්වාද, සෙනසුරාදා දිනයන්හි පෙරවරු 7 සිට 10.30 දක්වා ද යන කාලයන් තුළ පමණි.

4. මුදලින් රුපියල් විසිපහක් (රු. 25) කොළඹ බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්‍යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ එකී මුදල තැන්පත් කළ බවට කුවිතාන්සියක් පහත අත්සන් කරන අයට ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා නිකුත් කරන ටෙන්ඩර් ෆෝර්ම වර්‍ෂ 1960 ජූලි මස 28 වෙනිදා පස්වරු 2 දක්වා ලබාගත හැක.

5. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙළවරෙහි "ලී කඳන් ගෙන ඒම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන්කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේ ඒ සඳහා වෙන්කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කළහැක.

6. නියම කරන ලද මිල ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් සහ ඉලක්කම් වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නො කළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයෙන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීම් හෝ අමුතු එක් කිරීම් ඇතුළත් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින් ම අත්සන යොදා සැබෑ බව සහතික කළ යුතුය.

7. වර්‍ෂ 1960 ජූලි මස 29 වෙනි දින පෙරවරු 10ට පහත අත්සන් කරන ලද අයගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටිය හැක.

8. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතා ලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරීවරයා වෙත පැවරී ඇත.

9. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ දින සිට දින 10ක් ඇතුළත දී බන්ධනාගාර කර්මාන්ත අධිකාරීන් සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුය.

10. වැඩි විස්තර දැන ගැනීමට පහත අත්සන් කරන අයගෙන් විමසන්න.

ජේ. ඒ. පෙරුමාල්,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

1960 ජූලි මස 8 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දීය.

---

## 1960-61 මුදල් වර්‍ෂය තුළ කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ බේකරියට වියලි බේකරි මුහුන් සහ බේකරි දුන්තෙල් සැපයීම

වර්‍ෂ 1960 ජූලි මස 29 වෙනි දින පෙරවරු 9.30 දක්වා පහත අත්සන් කරන අය විසින් 1960-61 මුදල් වර්‍ෂය තුළ පහත සඳහන් ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයේ බේකරියට සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| | ටෙන්ඩර් පත්‍රය සඳහා තැන්පත් කළයුතු මුදල | ඇප මුදල | මසකට අවශ්‍ය ප්‍රමාණය රාත්තල් |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | |
| වියලි බේකරි මුහුන් | ... 10 0 | ... 100 0 | ... 80 |
| බේකරි දුන්තෙල් | ... 10 0 | ... 100 0 | ... 700 |

(ද්‍රව්‍ය සම්බන්ධයෙන් සැම්පලයන් පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයට භාර දිය යුතුයි.)

2. කොළඹ බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්‍යාලයේ හෝ කොළඹින් පිට පළාත්වල නම් ඕනෑම කච්චේරියක හෝ නියමිත මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් පහත අත්සන් කරන අයට ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා නිකුත් කරන ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1960 ජූලි මස 28 වෙනිදා පස්වරු 2 දක්වා ලබාගත හැක.

3. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙළවරෙහි "වියලි බේකරි මුහුන්/බේකරි දුන්තෙල් සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කළ හැකිය.

4. නියම කරන ලද මිල ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් සහ ඉලක්කම් වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නො කළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීම් හෝ අමුතු එක් කිරීම් ඇතුළත් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බව සහතික කළ යුතුය.

5. වර්‍ෂ 1960 ජූලි මස 29 වෙනි දින පෙරවරු 10ට පහත අත්සන් කරන ලද අයගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටිය හැක.

6. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතා ලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරිවරයා වෙත පැවරී ඇත.

7. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ දින සිට දින 10ක් ඇතුළත දී බන්ධනාගාර කර්මාන්ත අධිකාරීන් සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුය.

8 වැඩි විස්තර දැනැ ගැනීමට පහත අත්සන් කරන අයගෙන් විමසනු මැනැවි.

ජේ. ඒ. පෙරුමාල්,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

1960 ජූලි මස 8 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බටහිර කොට්ඨාශය

කොළඹ 8, කෝට්ටේ පාරේ, බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්—

(1) තැදුන්ගමුව ඇලහරහා අමුණක් තැනීම (අමුණු අංක 1)
(2) තැදුන්ගමුව ඇලහරහා අමුණක් තැනීම (අමුණු අංක 2)
(3) කොස්සින්න අමුණ තැනීම,
(4) ඉහල කෝට්ටේ අමුණ සංවර්ධනය කිරීම.

යන වැඩ සඳහා පිළිවෙලින් මෙම දෙපාර්තමේන්තුවේ රු. 12,000, 12,000, 12,000 සහ 6,000 හෝ ඊට වැඩි ප්‍රමාණවලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා පිළිගත් විවිධ සේවා සමුපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලින් 1960 අගෝස්තු 2 වන අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා වෙන වෙනම මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් භාර ගන්නවා ඇත.

මේ පිළිබඳ වැඩි විස්තර සැලැස්ම හා ටෙන්ඩර් ෆෝර්ම පත්‍ර අත්තනගළු ඔය යෝජනා ක්‍රමයේ උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැනගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත් එවිය යුත්තේ අනු පිටපතක් ද සමගය.

ටෙන්ඩර් පත් 1960 ජූලි මස 12 වන දින සිට 1960 ජූලි මස 29 වන දින දක්වා කාර්යාලයන්හි රාජකාරි කරන වේලාවන් අතරදී ලබාගත හැක. ඒ සඳහා ඕනෑම කච්චේරියක හෝ මෙහි පහත සඳහන් කාර්යාලයෙහි රු. 25 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් තම සුදුසුකම් සමග ඉදිරිපත් කිරීම අවශ්‍යවේ.

යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රශ්න රහිතව ප්‍රතික්ෂෙප කිරීමත් ඕනෑම ටෙන්ඩර් පතක ඕනෑම කොටසක් පිළිගැනීමේත් බලය රජය සතුවේ.

ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කළ අයට කැමතිනම් පැමිණ සිටිය හැක.

ටී. ඇල්. එම්. බලදස,
උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි,
අත්තනගළු ඔය යෝජනාක්‍රමය,

වාරිමාර්ග කාර්‍යාලය,
ගම්පහ, 1960.6.24.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර කොට්ඨාශ භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960.8.3 වෙනි දින පෙරවරු 10 දක්වා මිණිපේ වාරිමාර්ග උප කොට්ඨාශයට අයත් මිණිපේ—යෝධ ඇල දීර්ඝ කිරීමේ ව්‍යාපාරයේ "ප්‍රධාන සොරොව්ව වැඩි දියුණු කිරීම" සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 28,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර්පත්‍ර භාර ගනු ලැබේ.

2. පිටපත් දෙකකින් යුක්ත වූ ටෙන්ඩර් පත්‍රිකා මිණිපේ වාරිමාර්ග ඉංජිනේරුතැන වෙතින් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. (මෙම පිටපත් දෙකම ඉදිරිපත් කළ යුතුයි.) මේ සම්බන්ධ සියලු විස්තර සහිත කරුණු එම කාර්යාලයෙන් ලබා ගත හැක.

3. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවද සඳහන් වන සහතිකපත්‍ර ඒ ඒ නිලධාරීන්ගෙන් ලබා ගෙන ටෙන්ඩර්පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුයි.

4. මිණිපේ වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියේ මේ වැඩය සඳහා රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1960.7.11 වෙනි දින සිට 1960.7.27 වෙනි දින දක්වා ඇති රාජකාරියට නියමිත දවස් සහ වේලාවලදී මිණිපේ වාරිමාර්ග කාර්යාලයෙන් පමණක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

ප. වි. ධර්මපාල,
මිණිපේ උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුතැන.

මිණිපේ වාරිමාර්ග කාර්යාලය,
1960. 6. 24 වෙනි දින දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මධ්‍යම කොට්ඨාශ භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා පෙරවරු 10 තෙක් පහත සඳහන් වැඩ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි ඒ ඒ විෂයයන් සඳහා ඉදිරියෙන් සඳහන් මුදල් ප්‍රමාණයන් අනුව ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් සීල් තබන ලද ටැන්ඩර් භාරගනු ලැබේ :—

| | වැඩ පිළිබඳ විස්තරය | ලියා පදිංචි ප්‍රමාණය | ටැන්ඩර් අත්තිකාරම් මුදල |
|---|---|---|---|
| 1. | කනිෂ්ඨ නිළධාරීන්ගේ නිවාස තැනීම, නුවර එළිය... අංක 5. ... | 20,000 0 ... | 25 0 |
| 2 | එම ... අංක 6 ... | 20,000 0 ... | 25 0 |
| 3. | එම ... අංක 7 ... | 20,000 0 ... | 25 0 |

මහනුවර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 60. 7. 11 වෙනි දින සිට 60. 8. 1 වෙනි දින දක්වා පමණි. මෙම වැඩ සඳහා ටැන්ඩර් එව්ය හැක්කේ මෙම දෙපාර්ත මේන්තුවේ ඉහත සඳහන්ව ඇති විෂයයන් ඉදිරියේ සඳහන් මුදලට හෝ ඊට වඩා ලියාපදිංචිවී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටැන්ඩර් පෝර්මවලට ගෙවිය යුතු අත්තිකාරම් මුදල් කච්චේරියේ හෝ මහනුවර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ තැන්පත්කොට ලබාගත් කුවිතාන්සිය ටැන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුයි. කිසිම විමසීමක් නොමැතිව ඕනෑම ටැන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් පිළිගැනීමේ හෝ සියළුම ප්‍රතික්ෂෙප කිරීමේ හෝ බලය රජය සතුය. වැඩි විස්තර මහනුවර වාරිමාර්ග ඉජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

යූ. ඩී. වීරසිංහ,
වාරිමාර්ග ඉංජිනේරු තැන වෙනුවට,

මහනුවර.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය භාර නාගලලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් වග්ගලමෝදර කරදිය වැළැක්වීමේ යෝජිත ව්‍යාපාරය යටතේ යටගම දියපාලන බැම්මට ඉස්සිය හැකි ගේට්ටු සවිකිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 10,000කට හෝ ඊට වැඩි වශයෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් අගෝස්තු මස 2 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ජූලි මස 25 වෙනි දින සිට 30 වෙනි දින දක්වා කාර්යාලීය වේලාවන් හිදී ටෙන්ඩර් පත්‍ර. පහත අත්සන් කරන මා විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පෙර එක ටෙන්ඩරයක් වෙනුවෙන් රු. 25ක් කච්චේරියක හෝ මෙම කාර්යාලයේ හෝ තැන්පත් කොට කුවිත්තාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී සටහන් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන්ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. ඩී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
ගාළු උප කොට්ඨාශය.

1960.7.1,
වාරිමාර්ග කාර්යාලය, ගාල්ල.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමල උප කොට්ඨාශය

ත්‍රිකුණාමළය කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පිළිවෙලින් රු. 15,000 සහ රු. 12,000 හෝ ඊට වැඩියෙන් වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ත්‍රිකුණාමළයේ ඇතුළු වරාය පාරේ හා අලන්කුලමේ ස්ථිර කම්කරු පූර්වූ නිවාස 2ක් තැනීම සඳහා 1960 ජූලි මස 27 වැනි බදාදා පෙරවරු 9.30 වන තෙක් වෙන වෙනම මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කාර්යාලීය වේලාවන් තුළදී 1960.7.23 දා තෙක් පහත අත්සන් තබන අයගේ කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘතිපත් සම්පූර්ණකර අත්සන් තබා අනුපිටපත් සමග 1960.7.27 වැනිදා පෙරවරු 9.30 හෝ ඊට පෙර ත්‍රිකුණාමළයේ ඔර්ස් හිල්හි ත්‍රිකුණා මළය කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ලැබෙන සේ වම් උඩ කෙලවරේ වැඩේ නම ලියා මුද්‍රා තබන ලද කවරවල බහා එව්ය යුතුය.

3. ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලබන්නේ තම සුදුසුකම් සමග එක ටෙන්ඩර් පතකට රු. 25 බැගින් මුදල් ඕනෑම කච්චේරියක තැන්පත කොට ලබාගත් රිසිට්පතක් ඉදිරිපත් කරන අයට පමණය.

4. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය තම වැඩ සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත් ටෙන්ඩර් පත් ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර් ඉදිරිපත් කළ අයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

6. වැඩි විස්තර පහත අත්සන් තබන අයගේ කාර්යාලයෙන් දැනගත හැක. මීට අදාල කොන්දේසි හා සැලැස්ම යනාදියද මෙහිදීම බලාගත හැක.

කේ. සිවසුබ්‍රමනියම්,
ත්‍රිකුණාමළය උප කොට්ඨාශය භාර වාරිමාර්ග නිලධාරි තැන.

1960.7.1 වැනිදා,
වාරිමාර්ග කාර්යාලය, ඇතුළු වරාය පාර, ත්‍රිකුණාමළය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ කාර්මික සහකාර නිලධාරීන්ගේ අර්ධ ස්ථිර නිවාස 3 ක් සෑදීම සඳහා 1960 ජූලි මස 27 වෙනි බුද දින පෙ. ව. 9.30 දක්වා ටැන්ඩර් භාරගනු ලැබේ.

2. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම පෝර්ම නිසි ලෙස පුරවා කොන්ත්‍රාත් කරුගේ අත්සන සහ දාතම යොදා කවරයක බහා සීල් තබා එව්ය යුතුය. ලියුම් කවර යේ උඩ වම් කෙළවරෙහි වැඩයේ නම සඳහන් කළ යුතුය. මෙම ටැන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එව්ය යුතුය. නො එසේ නම් එතුමාගේ කාර් යාලයේ ඇති ටැන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. මෙම වැඩයට අදාල සියළුම තොරතුරු හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් විමසා දැනගත හැකි අතර සිතියම් ආදිය එතුමාගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

3. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1960 ජූලි මස 26 වෙනි දින දහවල් 12 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රු. 12,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත් කරුවනට පමණක් ටැන්ඩර් නිකුත් කරනු ලැබේ. මෙම පෝර්ම ලබාගැනීමේ දී රු. 25 ක මුදලක් තැන් පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල වාරිමාර්ග අධ්‍යක්ෂක තැන වෙනුවෙන් කච්චේරියේ තැන්පත් කළ හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන.
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

මකුල්පොත,
ඉබ්බාගමුව.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාර යේ වම් ඇල හරහා පාලමක් සෑදීම සඳහා 1960 ජූලි මස 27 බුද දින පෙ. ව. 9.30 දක්වා ටැන්ඩර් භාරගනු ලැබේ.

2. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් ෆෝර්ම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම ෆෝර්ම නිසි ලෙස පුරවා කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ දුතම යොදා කවරයක බහා සීල් තබා එවිය යුතුය. ලියුම්කවරයේ උඩ වම් කෙලවරෙහි වැඩයේ නම සඳහන් කළ යුතුය. මෙම ටැන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ලියා පදිංචිකළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේනම් එතුමාගේ කාර්යාලයේ ඇති ටැන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. මෙම වැඩයට අදාල සියළුම තොරතුරු හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් විමසා දැනගත හැකි අතර සිතියම් ආදිය එතුමාගේ කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක.

3. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ 1960 ජූලි මස 26 වෙනි දින දවල් 12 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රු. 6,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති බව ඔප්පු කළහැකි කොන්ත්‍රාත් කරුවනට පමණක් ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම ෆෝර්ම ලබාගැනීමේ දී රු. 25ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල වාරිමාර්ග අධ්‍යක්ෂක තැන වෙනුවෙන් කච්චේරියේ තැන්පත් කළ හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

වාරිමාර්ග කාර්යාලය,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය,
මකුල්පොත.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ ගොවිපලේ අක්කර 400ක ගොයම් කැපීම, කුඹුරේ සිට යාර 150ක් පමණ දුර ඇති පාගන ස්ථානයකට ගොයම් ගෙනයාම සහ අඩුක් කිරීම

පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූලි මස 29 වැනිදා පස්වරු 230 දක්වා හිඟුරක්ගොඩ ගොවිපලේ අක්කර 400ක ගොයම් කැපීම, කුඹුරේ සිට යාර 150ක් පමණ දුර ඇති පාගන ස්ථානයට ගොයම් ගෙනයාම සහ අඩුක් කිරීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(අ) ගොයම් කැපීම 1960 අගෝස්තු මාසයේ මැදදී ආරම්භ කොට සැප්තැම්බර් මස අවසන් වීමට පෙර සම්පූර්ණ කළ යුතුයි.

(ආ) අඩුම ගණනේ දිනකට අක්කර 20ක පමණ ගොයම් කැපිය යුතුයි. ගොයම් කපා දෙදිනක් ඇතුලත එසේ කපන ලද ගොයම් (තෙත්වී නැත්නම්) කුඹුරේ සිට ගෙන ගොස් අඩුක් කළ යුතුයි. මෙය වී වැටෙන්නට නොදී කළ යුතුය. අගල් 6කට වැඩි ඉපනැල්ලක් කුඹුරේ නොතිබිය යුතුයි.

(ඉ) සඳහන් මිළ ගණන අක්කරයක් පිණිස විය යුතු අතර තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ගොයම් කැපීමට ඇති සම්පූර්ණ අක්කර ප්‍රමාණය හෝ ඉන් කොටසක් භාරගැනීමට එකඟ විය යුතුයි.

(ඊ) සම්පූර්ණ වැඩ කොටසම ගොවිපලේ කළමනාකාර තැනගේ හෝ ඔහුගේ නියෝජිතයෙකුගේ නියමය පරිදි කළ යුතුයි.

2. පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ෆෝර්මකොළ ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා පාවිච්චි කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තවිය යුතුවාත් හැර එය අත්සන් තබා, ලියුම් කවරයක බහා සීල් තබා "හිඟුරක්ගොඩ ගොවිපලේ ගොයම් කැපීමේ ටෙන්ඩරය" යන්න එම ලියුම් කවරයේ වම් පැත්තේ මුදුනේ ලියා පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත යැවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25ක් කච්චේරියක හෝ භාණ්ඩාගාරයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. තෝරාගන්නා ලද ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බැව් දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීම හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් තැබීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරණ අතර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුළත් කරනවා ඇත.

4. ටෙන්ඩර් පත්‍ර පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත්කළ හැකිය. නො එසේ නම් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නො එවන්නේ නම් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔහුගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට බලය ලත් නිලධාරි තැන වන පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් පිළිබඳ ලිපිකරු තැන වෙත ටෙන්ඩර් පත්‍ර අතින්ම භාරදිය යුතුය. එසේ කරණ ලද ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා සීල් තබා "හිඟුරක්ගොඩ ගොවිපලේ ගොයම් කැපීමේ ටෙන්ඩරය" යන්න හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

5. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරන දිනයේදීම ටෙන්ඩර්කරුවන්ට දන්වා යවනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 4ක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් එම ටෙන්ඩර්කරු වහාම ඒ බව පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත දැනුම් දිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේ පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරණු ලැබේ.

7. නියමිත ෆෝර්මයෙහි ලියා නැති, නැතහොත්, එහි නියමිත කොන්දේසි නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතු අතර ඒවායේ යම්කිසි වෙනසක් කළහොත් එහි ටෙන්ඩර්කරුගේ කෙටි අත්සනද යෙදිය යුතුය. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කර තිබෙන ගණන් අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන් කර තිබිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණ සියලුම මිළ ගණන් ටෙන්ඩර් පත්‍ර කැඳවා අවසාන දින සිට සති තුනකටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුය.

9. පිළිගනු ලැබූ මුලු වටිනාකමින් සියයට පහක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගන්නා ලද ටෙන්ඩර්කරුවාට නියම කරණු ලැබේ. මෙම ඇප මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීමෙන් පසුවය. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළොත් ඔහුගේ ඇප මුදල රාජ සන්තක කරණ අතර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුළත් කරනවා ඇත. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට අවශ්‍ය මුද්දරවල වටිනාකම තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය රජය සතුවේ.

11. කොන්ත්‍රාත්කරුගේ සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) හෝ ඊට අදාල ව්‍යවස්ථානුකූල වෙනස්කම් හා ඒවා යටතේ ඉදිරිපත් කරණ ඉල්ලුම් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

12. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි.

ලාංකික යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

13. වැඩට ගැනීමට නුසුදුසුයයි හැඟෙන ඕනෑම කම්කරුවෙක් කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය රජය සතුවේ.

14. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට අවශ්‍යයයි පෙනී ගියහොත් තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ වියදමෙන් ඇපකරුවන් එක් කෙනෙක් ලවා හෝ ඊට වැඩි ගණනක් ලවා හෝ පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානමින් සිටිය යුතුයි. මෙම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ අය විය යුතුයි.

15. කොන්ත්‍රාත්තුවේ සඳහන් වැඩය අසතුටු දායක ලෙස කිරීම නිසාත්, කොන්දේසි ඉටු නොකිරීම නිසාත් කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන සතුවේ.

16. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයේ නම් සඳහන් කෙනෙකු සමග හෝ එම් අය සහ එකතුව ඉදිරිපත් වන කෙනෙකු සමග හෝ රජයට නුසුදුසු යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, නැතහොත් ඔහු විසින් සපයා ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වහොත් හෝ එම ස්ථානයෙහි තැබුවහොත් එම දැන්වීම් ඔහුට දුන් ලෙස සලකනු ලැබේ.

ඉල්ලුම් පත්‍ර අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින්ම හෝ මට හෝ කාර්යාලයේ මා නැති අතර මෙම කාර්යාලයේ ප්‍රධාන ලිපිකාර තැනට හෝ භාර දිය හැක.

3. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර සීල් තබා පිටකවරයේ ටෙන්ඩර් ඉල්ලුම් කරන වැඩය සඳහන් කිරීමට හා තමාගේ නම හා ලිපිනය එහි සඳහන් කිරීමට ද අමතක නොකළ යුතුය.

4. එක් එක් වැඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර පිටපත් දෙක බැගින් එවිය යුතුය. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවැනි පිටපත් පරීක්ෂා කර බැලීම අවශ්‍යයයි හැඟෙතොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සමග සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය විධිවිධාන යොදා ගත හැක.

5. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සළකා බැලීම 26.7.60 වැනි දින පෙරවරු 10.30 ට කරනු ලබන හෙයින් කොන්ත්‍රාත්කරුවනට ද එදින ඒ වේලාවට මෙම කායසීලයට පැමිණ ඒවා විවෘත කරනවා බැලිය හැක.

6. වැඩ විස්තර හා ආකෘති පත්‍ර වෂී 1960 ක්වූ ජූලි මස 25 වැනි දින පෙරවරු 10 තෙක් මගෙන් ලබා ගත හැක. මේ ආකෘති පත්‍ර ලබා ගැනීමට ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 889 (අයි) දරණ මුදල් රෙගුලාසිය අනුව, ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල වන රු. 10 රත්නපුර කච්චේරියේ තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. මෙකී ඇප මුදල (අ) සමුපකාර තොග වෙළඳ ආයතනය, (ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුන් : "වෛයිනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝපරේෂන්" (ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමන් විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තුමන් විසින් ලියාපදිංචි කරනු ලැබූ සමුපකාර සමිති යන මේවායින් අවශ්‍ය නොවේ.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී පළමුව තමා විසින්ම ඉල්ලුම් කරන වැඩය සවිස්තරව පරීක්ෂා කර බලා ගත් බැව් ඉල්ලුම් පත්‍ර ගැන සැළකීමේදී හඟිනු ලැබේ.

බී. සී. ආර්. ජයසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
රත්නපුර දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා කායසීලය,
බටුගෙදර, රත්නපුර,
1960. 6. 30.

## උපලේඛනය

| | කළ යුතු වැඩ | | ගම | | කෝරළය |
|---|---|---|---|---|---|
| 1. | ගැටණ අමුණ | ... | යකුදගොඩ | ... | කුරුවිටි |
| 2. | කටුගස්ඇළ අමුණට ලෑලි සැපයීම | ... | කටුගස්ඇළ | ... | එම |
| 3. | මිල්ලගහ ලියැද්දේ පැති බැම්ම | ... | ගලහිටිය, පුස්සැල්ල | | එම |
| 4. | නාරංගහ කුඹුරුයායේ අමුණ | ... | හිඳුරන්ගල | ... | එම |
| 5. | කැන්දගහ දෙනිය අමුණ | ... | නිර්ල්ගම | ... | නවදුන් |
| 6. | පෙත්තරේ දොළ අමුණ | | බටුගෙදර | ... | එම |
| 7. | උණපඳුරගාවා අමුණ | | දෙ. පාතකඩ | ... | එම |
| 8. | නාරංගොඩ වේල්ල | ... | නාරංගොඩ | ... | එම |
| 9. | නානදෙළ අමුණ | ... | උඩපස්ගමුව | ... | කුකුළු |
| 10. | බෙලිඅත්තෙ කුඹුරුයාය වාරි කර්මාන්තය | ... | වේවැල් කඳුර | ... | එම |
| 11. | අහුල් කඳුරේ වේල්ලේ අමුණ | ... | වැද්දගල | ... | එම |
| 12. | ඇඹිළිතැන්නේ වේල්ලේ පැති බැම්ම | ... | ගහලගමුව | ... | එම |
| 13. | නාවිනි ඇළේ වේල්ල | ... | ඕපනායකේ | ... | කඩවත හා මැද |
| 14. | ගල්ලැලිතොට වැව | ... | තංජන්තැන්න | ... | එම |
| 15. | විලකුඹුරේ පැති බැම්ම | ... | කෙහෙල්ඔවිටගම | ... | නවදුන් |

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### හල්විටිගල-දම්මල පාරේ සැතපුම් දෙකක් තුළ තාර දැමීම

කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ගාලු දිස්ත්‍රික්කයේ හල්විටිගල-දම්මල පාරේ සැතපුම් දෙකක් තුළ තාර දැමීම සඳහා 1960 අගෝස්තු මස 2 වෙනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. කොළඹ මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයේදී 1960 අගෝස්තු මස 2 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 15,000 කට අධික ප්‍රමාණයකට ලියාපදිංචි වූවන්ට පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලැබේ. කොළඹ ඉඩම් සංවර්ධන කාර්යාලයේ හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

3. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් 1960 ජූලි මස 28 වෙනි දින තෙක් ලබාගත හැකි පෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. වැඩිදුර කරුණු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැක.

ඇස්. නවසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූනි මස 21 වැනි දින,
කොළඹ එච්ලන් චතුරශ්‍රයේ
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාළු කොට්ඨාශය

### බඩුබාහිරාදිය එහාමෙහා ගෙන යෑම

1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1962 සැප්තැම්බර් 30 වැනි දායින් අවසන්වන දෙවර්ෂය තුළ මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් දුම්රිය ස්ථාන බාහිර බඩු ගබඩා හා සෞඛ්‍ය ආයතනයන් අතර (ගාළු නගර සීමාව තුළ පිහිටි ආයතනයන් හැර) බඩුබාහිරාදිය එහා මෙහා ගෙන යෑම සඳහා වෙන් වශයෙන් සීල් තැබූ ටැන්ඩර් පත් ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ සමිති හා සමාගම් වලින් ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් බාරගනු ලැබේ.

2. 1960 අගෝස්තු 5 වැනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වුවහොත් සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ අනුපිටපත් පරීක්ෂා කළ හැක.

3. මෙම කාර්යාලයෙන් හෝ කොළඹ, කළුතර, මාතර, මඩකලපුව, බදුල්ල, මාතලේ, මහනුවර, කුරුණෑගල, කෑගල්ල, පුත්තලම, රත්නපුරය, අනුරාධපුරය, වව්නියාව සහ යාපනය යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාල වලින් ලබාගන්නා ලද ටෙන්ඩර් පෝර්ම අනුපිටපතක් සමග එවිය යුතුයි. අයදුම් කරුවන් විසින් මෙයට යාකොට ඇති උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මුදල කච්චේරියේ තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනට පෙරදින දවල් දොළහට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබා ගත යුතුයි.

4. තැපෑලෙන් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා පෝර්ම ලබාගත හැකිය.

5. සෑම ටෙන්ඩරයක්ම ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන වෙත එවිය යුතුය. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය එවන කවරයේ වම්පස උඩ කෙළවරේ සේවයේ විස්තරය පැහැදිලිව ලිවිය යුතුයි. එම කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය හැකිය. නැතහොත් ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැනට පුද්ගලිකව භාරදී එය ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත හැකිය. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10ට පසු තැපෑලෙන් ලැබෙන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරණු ලැබේ.

6. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තමන්ගේ වටිනාකම පිළිබඳව තොරතුරු මට හෝ ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට බලාපොරොත්තු වන නිලධාරීන්ට දැන්විය යුතුයි. ඒ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් හෝ 3 වැනි ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාල වලින් ලබාගත හැකිය. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු දරන අයදුම්කරුවන් ඒ බව සඳහන් කළ යුතුයි. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු නොදරන අය තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු සපයා තිබේද? එසේනම් කවරකු වෙතද යන්න සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳව තොරතුරු දැනගැනීමට ප්‍රථම ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් භාර ගැනීමට නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව සපයා එවිය යුතුයි.

7. පහත සඳහන් කොන්දේසිවලට ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. :—

(අ) බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යැමේදී හැතැප්ම බාගය හා ඉන් වැඩි කොටස හැතැක්මක් ලෙය ගණන් බලා මුදල් ගෙවනු ලැබේ. හැතැක්ම බාගයට අඩු දුර ප්‍රමාණයට නියම දුර ප්‍රමාණයේ මුදල ගෙවනු ලැබේ.

(ආ) ටොන් එකකට වඩා බර එහා මෙහා ගෙන යැමට ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි තැනගේ නිර්දේශය අනුව ගෙවනු ලැබේ.

(ඉ) අළුතෙන් විවෘත කරන ආයතනවල බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යැමට ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ ගණන් අනුව ගෙවනු ලැබේ.

8. ටෙන්ඩර් පෝර්මයේ පිටපැත්තේ ටෙන්ඩර් කොන්දේසි දක්වා ඇත. ටෙන්ඩර් ඉදිරිපත් කරන විට මෙම කොන්දේසි පිළිපැදිය යුතුයි. කිසිම හේතුවක් නොදක්වා යම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

ඇස්. තිරුනාවුකරසු,
සෞඛ්‍ය සේවා අධිකාරි තැන.

1960 ජූනි 30 වැනිදා,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

උප ලේඛනය

| 1 | 2 | 3 |
|---|---|---|
| සෞඛ්‍ය ආයතන හා පහත සඳහන් දුම්රිය ස්ථාන/බාහිර බඩු ගබඩා අතර බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යැම | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල |
| | රු. ශ. | රු. ශ. |
| දිස්ත්‍රික්කය | | |
| අළුත්ගම, ඉඳුරුව, කොස්ගොඩ, බලපිටිය, අම්බලන්ගොඩ, කහාව, හික්කඩුව, දොඩන්දූව ... ... | 100 0 ... | 300 0 |
| ගාල්ල, අහන්ගම, උනවටුන හා තල්පේ ... ... ... | 100 0 ... | 300 0 |

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1960 ඔක්තෝබර් 1 වනද සිට 1961 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුල, මේ සමග ඇති උප ලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන්වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මුවදෙර මහ ලේකම් කාර්‍යාලය යාබද ''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැන විසින් භාරගනු ලැබේ.

2. (I) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

සැ.යු.—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වූවමනා පෝර්ම මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන නැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නො වන මොනම ටෙන්ඩර්යක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත වේලාසනින් එවිය යුතුයි.

3. **වත් කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වූවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙය දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වූවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ, ''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්‍යාලය, ගාලු මුවදෙර, කොළඹ,'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක්ද යන්න පැහැදිලිව සඳහන් කළයුතු මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන්කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන්ද සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතීනම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩරකරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසාදෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දන ගතයුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අංශය, ගාලු මුවදෙර,
මහලේකම් කාර්‍යාලය, කොළඹ.
4.7.1960.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

උපලේඛනයේ පරිදි

| (1) ආයතනය | (2) ටෙන්ඩර් පත් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් පත්‍ර සඳහා අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|
| නේබොඩ ආරෝග්‍යශාලාව | 100 | 1,000 | 1960.7.29 පෙ.ව. 10ට |
| පිඹුර ආරෝග්‍යශාලාව | 100 | 1,000 | |
| වලස්මුල්ල ආරෝග්‍යශාලාව | 100 | 1,000 | |
| මීහින්තලේ ආරෝග්‍යශාලාව | 100 | 800 | |

ආහාර—දළ වශයෙන්

| | නෑබොඩ රෝහල | පිඹුර රෝහල | වලස්මුල්ල රෝහල | මීහින්තලේ රෝහල |
|---|---|---|---|---|
| ආහාර—සේවකයන් සඳහා— | | | | |
| අළුත් මාලු | — | 1,000 | 1,400 | 700 |
| හරක් මස් | 800 | 950 | 1,400 | 400 |
| කරවල | 1,700 | 900 | 1,600 | 1,550 |
| එළවලු | 3,500 | 3,750 | 5,450 | 2,500 |
| ලෙඩුන් සඳහා— | | | | |
| අළුත් මාළු | — | 3,600 | 7,350 | 1,000 |
| හරක් මස් | 1,000 | 2,350 | 6,800 | 550 |
| කරවල | 5,450 | 3,000 | 6,850 | 2,050 |
| එළවලු | 12,550 | 15,200 | 26,800 | 3,450 |
| (කිරි ආහාර) | — | — | 13,500 | — |
| ක්‍ෂය රෝගීන් සඳහා— | | | | |
| හරක් මස් | 3,400 | 400 | 550 | 1,050 |
| එළු මස් | 1,150 | — | 550 | 1,000 |
| කුකුළ් මස් | 1,100 | 200 | 600 | 1,000 |
| එළවලු | 1,150 | 650 | 1,650 | 3,000 |
| අළුත් මාලු | 1,150 | 200 | 550 | 1,000 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැති පිසූ/නොපිසූ ආහාර පමණක් සැපයීම

වර්ෂ 1960 ඔක්තෝබර් 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනිදාසින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙන් දක්වා ඇති ආයතනයන්ට කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම සඳහා එවනු ලබන සීල් තබනු ලැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලයේ, තැ. පෙ. 500, සෞඛ්‍ය සහ සමාජසේවා අමාත්‍යාංශයේ දී ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 2 වැනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ ආයතනවලින් ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන් හෝ කොළඹ, කළුතර, ගාල්ල, මාතර, කෑගල්ල, මහනුවර, මාතලේ, බදුල්ල, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, වව්නියා, යාපනය, රත්නපුරේ සහ පුත්තලම යන තැන්වල පිහිටි, සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාල වලින් ලබාගත්තා ටෙන්ඩර් පෝර්මවල කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලයේ සෞඛ්‍ය සහ සමාජසේවා අමාත්‍යාංශයේ තැ. පෙ. 500, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත, අනුපිටපතක් සමග ටෙන්ඩර් සැපයිය යුතුයි. නියම පෝර්මයේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

3. මේ සමග ඇති උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට, කොළඹ කච්චේරියේ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවෙහි තැන්පත් කළ බවට, නිකුත් කෙරෙන කුවිතාන්සි ටෙන්ඩර්පත් ලබාගැනීමට ප්‍රථම ලබාගත යුතුයි. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂකතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන තැන්පත් මුදල්, ලංකා බැංකුව භාරගනු නොලැබේ.

අයදුම්කරුවන් ටෙන්ඩර් තැන්පත් මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම දින දවල් 12 ට කලින් ඉදිරිපත් කිරීමෙන්, අවශ්‍ය පෝර්ම කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂක තැනගෙන් හෝ ඔවුන් පෝරම ලබාගැනීමට බලා පොරොත්තුවන, සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් ලබා ගත හැක. තැපැලෙන් ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කරන අය කල් වේලා ඇතිව ඉහත කී කුවිතාන්සිය එවා, ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවිය යුතුයි.

4. සෑම ටෙන්ඩරයක්ම කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලයේ තැ. පෙ. 500, සෞඛ්‍ය සහ සමාජසේවා අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර්පත්‍රය බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර පත් කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලයේ සෞඛ්‍ය සහ සමාජසේවා අමාත්‍යාංශයේ නො. 155 දරණ කාමරයේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට සිය ටෙන්ඩර පත් ලියාපදිංචි තැපැලෙන් ද එවිය හැක. ටෙන්ඩර්කරුවන් සිය ටෙන්ඩර්පත් ලියා පදිංචි තැපැලෙන් එවීමට අසතුටු නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට මෙහි පළමුවන ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති ටෙන්ඩර්පත් භාර ගැනීමට අවසරය ඇති සෞඛ්‍ය සහ සමාජසේවා අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට පුද්ගලිකව ටෙන්ඩර්පත් භාරදී, එය ලැබුනබවට කුවිතාන්සියක් ද ලබා ගත හැක. ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසාන දින දවල් 10 පසුවී තැපැලෙන් හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

